## II කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) ඔබ පාසලේ පුස්තකාලයෙන් ලබාගත් පොතක් සම්බන්ධව පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) පොතේ නම : .............................................................................................................. (ලකුණු 02)

(ii) පොතේ කර්තෘ : .......................................................................................................... (ලකුණු 02)

(iii) කියවූ කතාව කෙටියෙන් විස්තර කරන්න. : ......................................................................

.................................................................................................................................

.................................................................................................................................

................................................................................................................................. (ලකුණු 04)

(iv) ඔබට එම කතාවෙන් ගත හැකි ආදර්ශය කුමක් ද?

................................................................................................................................. (ලකුණු 02)

(2) පහත සඳහන් මාතෘකා අතුරින් **එකක්** තෝරාගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

(i) පාසලෙන් අපට අපෙන් පාසලට

(ii) මා හයවන ශ්‍රේණියට ඇතුළත් වූ දා

(iii) මිහිකත සුරකින තුරුලිය

(iv) උඩු ගුවනේ සංචාරයක යෙදුණෙමි. (ලකුණු 20)

(3) ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ ඔබගේ මිතුරෙකුට/මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 10)

(4) **පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) ''එකග වෙන්න ඕනෑ කාරණය මෙකයි.''

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතිය කුමක් ද?

(ආ) එම කෘතිය සම්පාදනය කළේ කවරෙක් ද?

(ii) උදලු හා කැත්ත කරේ තබාලා

සැහැල්ලුවෙන් බෝම දෙපානගාලා

................................................ ...........

................................................ ...........

ඉහත කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.

(iii) ''කුමක් නිසා උනු ද? පොකුණට බැස පැන් බොව.''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(iv) ඉර උදා වන්නට
පළමුව නැඟිට සිහිකොට

(අ) මෙම කවිය ඇතුළත් කෘතිය නම් කරන්න.

(ආ) එහි කතුවරයා කවරෙක් ද?

(v) ''පෙර කිසි කලෙ කැ නොවූ වෙනසක් මගේ සිතට දැනෙන්නට විය.''

(අ) මෙසේ සිතුවේ කවරෙක් ද?

(ආ) සිතට වෙනසක් දැනුණේ කුමක් දැකීමෙන් ද?

(ලකුණු 2 5 5 = 10)

(5) **පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අප සිටියේ ගස් කොළන් තුනී වූ පෙදෙසක බැවින්, පෙරට වඩා ඉක්මනින් අපට ගමන් කළ හැකි විය. පැයක් පමණ වේලා ගමන් ගත් අපට, ඉදිරියෙන් මොකක් දෝ සතකු ගොරවන හඬක් ඇසිණ. අපි තිගැස්සී, ඉදිරියට නො ගොස්, පරෙස්සම් සහිත ව සිටියෙමු. හඬ නැවත නැවතත් ඇසිණි. දැන් එකකුගේ නොව, දෙදෙනෙකුගේ හෝ ඊට වැඩි දෙනෙකුගේ ගෙරවීම හා බිරීම වැනි බියකරු හඬක් ඇසෙන්නට විය. හඬ ඇසුණු හැටියෙන් අපට හැඟුණේ ඔවුන් එකිනෙකා හා පොරකමින් සිටි බව ය. ටික වේලාවක් ගත වූයේ සතුන් පොරකන හඬ දැන් ළඟින් ම ඇසිණ. මොහොතකට පසු, ගස් පඳුරු අතරින් දුවැන්ත වලසුන් තිදෙනෙකු ඉදිරියට එනු අපි දිටිමු.

(i) මොවුන් ඉදිරියට පැමිණියේ කවුද?..........................................................................................

(ii) ඔවුන් කොපමණ වේලාවක් ගමන් ගත්තේ ද? ........................................................................................

(iii) මොවුන්ට ඉක්මනින් ගමන් කිරීමට හැකියාව ලැබුණේ ඇයි? ......................................................................

(iv) ඡේදයෙන් යුගල පදයක් උපුටා ලියන්න. .........................................................................................

(v) අනුක්ත පදයක් උපුටා ලියන්න. ..........................................................................................

(ලකුණු 2 5 5 = 10)